කොළොන්නාව නගර සභාව - 2022
------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළොන්නාව නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කොළොන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2018** අංක **19** දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) නගර සභාවේ **2018** අංක **19** දරණ ජාතික විගණන පනතේ **6 (1)** (ඇ) **(iii)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) **2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.**

**1.6** ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2021 වර්ෂයේදී ආරම්භ කිරීමට අපේක්ෂා කල පරිගණක මෘදුකාංගයක් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ අවලංගු කර තිබුණද, ඒ වෙනුවෙන් 2021 වර්ෂයේදී කෙරීගෙන යන වැඩ ගිණුමට හරකර තිබුණු රු.3,500,000ක ප්‍රතිපාදන සහ ණයහිමියන් ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි.** | **පිළිගන්නා බව.එම රු.3,500,000/- ක වටිනාකම කෙරීගෙන යන වැඩ ගිණුමෙන් හා ණයහිමි ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව.** | **නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ.** |
| (ආ) | **සෘජු ශ්‍රමය යටතේ සිදුකිරීමට අපේක්ෂිත මාර්ගයක් කොන්ක්‍රීට් කර සකස් කිරීම සඳහා වන ඇස්තමේන්තුගත වටිනාකම රු.225,000ක් කෙරීගෙන යන වැඩ ගිණුමට හර කර තිබුණි.** | **පිළිගන්නා බව. සෘජු ශ්‍රමය යටතේ සිදු කිරීමට අපේක්ෂිත ඇස්තමේන්තුගත වටිනාකම රු.225,000.00 ක් වූ මාර්ගයක් කොන්ක්‍රීට් කිරීම කෙරීගෙන යන වැඩ ගිණුමෙන් හා ණය හිමි ගිණුමෙන් ඉවත් කරන බව.** | **-එම-** |
| (ඇ) | **2021 වර්ෂයේ විකුණන ලද යන්ත්‍ර වෙනුවෙන් ගණනය කරන ලද ලාභය රු.1,305,140 ක් සමුච්චිත ගිණුමට බැර කරනු වෙනුවට 2022 වර්ෂයේ විවිධ ආදායම් ගිණුමට බැරකර තිබුණි.** | **පිළිගන්නා බව. මෙය පෙර වර්ෂයක ලද ආදායමක් බැවින් මේ වන විට සමුච්චිත අරමුදල් ගිණුමේ ගිණුම්ගත වී ඇත. ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවීමට වගබලා ගන්නා බව.** | **-එම-** |
| (ඈ) | **ගොඩනැගිලි සංවර්ධන කටයුතු වෙනුවෙන් ගොඩනැගිලි ගිණුමට හර කළ යුතු රු.5,247,345 ක් සවිකිරීම් ගිණුමට හර කර තිබුණි.** | **පිළිගන්නා බව. දෝෂය 2023/JE/10 මගින් නිවැරදි කරන බව.** | **-එම-** |

**1.6.1** විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **රු.59,950,301 ක් වූ ගිණුම් ශේෂ පහකට අදාළව හඳුනානොගත් ශේෂ ගිණුමට මාරු කිරීම සඳහා අනුමැතිය විස්තරාත්මක උපලේඛන හා ජ'නල් සටහන් සඳහා විස්තර ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.** | **වසර ගණනක් පැරණි ශේෂ පිළිබඳව සොයාබලා ගිණුම නිරවුල් කිරීමට කටයුතු කරන බව.** | **අදාල අනුමැතිය සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ.** |

**1.6.2 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ 104(1) | රු.52,000 ක් වටිනා පුස්තකාලයේ භාණ්ඩ අස්ථානගත වීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. | පිළිගනිමි. මේ වන විට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කර ඇති බව. | අදාල පරීක්ෂණ සිදුකර සිදුවූ හානිය ප්‍රතිපූර්ණය කරගත යුතු වේ. |
| (ii) මු.රෙ 371(5) | අත්තිකාරමක් නිකුත් කළ පසු අදාල කාර්යය අවසන් කර දින 10ක් ඇතුළත එම අත්තිකාරම පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 19දී ලබා දී තිබුණු රු.1,106,500ක් සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි. | අත්තිකාරම් ලබාගැනීමේදී, 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි මු.රෙ.371(5) සංශෝධනය ප්‍රකාරව කටයුතු කළයුතු බවට දැඩිව නිලධාරින්ට උපදෙස් ලබාදී ඇති බැවින් ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |
| (ආ) 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු පනතේ 20 වගන්තිය | වරිපනම් බදු අයකිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වර්ෂ 05කට වරක් තක්සේරු කළ යුතු වුවත් සභාව විසින් වසර 07 කට පෙර ලබා ගත් තක්සේරුවක් පදනම් කරගෙන වරිපනම් බදු තක්සේරු කර තිබුණි. | කොළොන්නාව නගර සභා බල ප්‍රදේශයේ දේපල තක්සේරුව වර්ෂ 2012 න් පසුව සිදුව නැත. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2023 අප්‍රෙල් මස සිට තක්සේරු කටයුතු ආරම්භ කරන බව ලිඛිතව දන්වා ඇත. ඒ අනුව තක්සේරු ප්‍රතිශෝධන කටයුතු 2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ හැකි බව. | සියළු නිශ්චල දේපළ කාලානුරූපීව තක්සේරු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.71,698,962 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.55,553,691 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 93,000,000 | 93,136,471 | 80,591,014 | 75,122,890 | 90,000,000 | 93,266,805 | 79,144,091 | 62,802,298 |
| (ii) කුලී | 12,117,142 | 12,117,142 | 9,783,082 | 2,334,060 | 5,860,562 | 5,860,562 | 4,446,015 | 1,414,547 |
| (iii) බලපත්‍ර ගාස්තු | 601,000 | 601,000 | 601,000 | - | 686,000 | 686,000 | 686,000 | - |
| (iv) වෙනත් ආදායම් | 6,485,000 | 7,095,252 | 7,095,252 | - | 6,037,727 | 6,037,727 | 6,037,727 | - |
| එකතුව | 112,203,142 | 112,949,865 | 98,070,348 | 77,456,950 | 102,584,289 | 105,851,094 | 90,313,833 | 64,216,845 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i)** වරිපනම් හා බදු<br>සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් වටිනාකම රු. 75,122,890 ක් වූ අතර එයින් රු.40,000 කට වඩා වැඩි හිඟ වටිනාකමක් ඇති වරිපනම් හිඟ ශේෂ 93 කින් 2023 අප්‍රේල් 03 දින වන විට අයවිය යුතු මුදල රු.28,713,200 ක් විය. | 2023.01.01 දිනට පැවති හිඟයෙන් රු.40,000 වැඩි වටිනාකමක් සහිත දේපල 26 කින් රු.11,316,758.58 ක මුදලක් අයකර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| **(ii)** මුද්දර ගාස්තු<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.260,000,000 ක් විය. | කොළඹ සහ දෙල්කඳ ඉඩම් රෙජිස්ටාර් කාර්යාල තුළ සිදුවිය යුතු ලේඛන යාවත්කාලීන කිරීම් සමාලෝචිත වර්ෂය තුළ සිදු වී නොමැති බැවින් 2020 සහ 2021 වර්ෂයට අදාල ලේඛන පරීක්ෂා කිරීම් මේ වන විට ආරම්භ කර ඇති බව. | ලැබිය යුතු මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ප්‍රජා සංවර්ධන නිලධාරිණියගේ ඉල්ලීමක් මත 2022 ජුනි මාසයේදී පළතුරු පැළ මිලදීගෙන මාස 04 කට අධික කාලයක් සභාවේ ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිරිපිට ගොඩගසා තිබුණු අතර ඉන් කොටසක් විනාශ වී තිබුණි. | පිළිගනිමි පැවති සමාජ වාතාවරණය හේතුවෙන් සේවකයින්ගේ පැමිණීම අවම මට්ටමක පැවති හෙයින් පැළ සභා භූමියේ තබා තිබූ අතර මේ වන විට වදුල්ලවත්ත වැනි ජනාකීර්ණ සහ කාර්මීකරණයට වැඩියෙන් ලක්වූ ප්‍රදේශ ආශ්‍රිතව එම පළතුරු පැල සිටුවා ඇති බව. | අදාල ප්‍රජා සංවර්ධන කටයුතු නොපමාව ඵලදායී ලෙස සිදුකළ යුතු වේ. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාග්ධන ව්‍යාපෘති හා සංවර්ධන කටයුතු සඳහා වෙන්කල මුදල්<br><br>ප්‍රවර්තන වර්ෂයේ සංවර්ධන කටයුතු 16 ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.6,300,000 න් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් රු.4,363,526 ක් උපයෝජනය කර නොතිබුණි. | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 03/2022 ජාතික අයවැය චක්‍රලේඛය අනුව වියදම් සීමා කිරීමට සිදු වූ බව. | චක්‍රලේඛ මගින් මූලධන වියදම් පමණක් සීමා කළයුතු අතර අනෙකුත් ද සිදුකළ යුතු වේ. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) කොළොන්නාව නගර සභාවේ කසළ කළමනාකරණ කටයුතු සඳහා සභාවට ලබාදී ඇති මීතොටමුල්ල ඉඩමෙහි ඉදිකර ඇති ගොඩනැගිලිවලින් කිහිපයක් කඩා ඉවත්කර තිබුණු අතර එහි කඩා ඉවත්කල යකඩ බාල්ක සහ අමානෝ ෂීට් සභාව වෙත ගෙන්වාගෙන තිබුණ ද ඒවා සභාවේ කිසිදු ඵලදායී කටයුත්තක යොදවා නොතිබුණි. | එම ගොඩනැගිලි ද්‍රව්‍ය ඵලදායි ලෙස භාවිතා ලෙස භාවිතා කර ඇත. ඒ අනුව, ගරාජය පුළුල් කර ඉදිකිරීමට නියමිත බැවින්, ඒ සඳහා එම ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයට ගැනිමට නියමිත ව ඇත. තවද, ගරාජයේ වාහන අමතර කොටස් සවිකිරීම සඳහාද යොදා ගෙන ඇති බව. | ඉවත්කිරීම් නැවත භාවිතයට ගත හැකිනම් ඒවා ඵලදායී ලෙස නැවත භාවිතා කළයුතු වේ. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිලධාරි 36 දෙනෙකුගෙන් සභාවට අයවිය යුතු රු.2,212,952ක ශේෂයක් වසර හතරකට වැඩි කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | අදාළ හිඟ වටිනාකම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා සභාවේ ඉදිකිරීම්, කර්මාන්ත පොදු පහසුකම් සහ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව විගණනය කළ යුතු අතර අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළ යුතු වේ. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු කරා ලඟා වීම සම්බන්ධයෙන් 2024 දක්වා කාලච්ඡේද හඳුනාගෙන තිබුණි. සැලැස්ම තුළ අදාළ ක්‍රියාකාරකම් හඳුනා ගෙන තිබුණු නමුත් 2022 වර්ෂය සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණු අතර 2019 වර්ෂයේ ප්‍රතිපාදන මුදලම සටහන් කර තිබුණි. | පිළිගනිමි. 2023 වර්ෂයේ 2024 වර්ෂයේදී සැලැස්ම යාවත්කාලීන කර අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | තිරසර සංවර්ධන අරමුණුවලට අදාල ක්‍රියාකාරකම් හඳුනාගෙන අයවැයෙන් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු වේ. |